
# මැතිවරණ කාර්යන් සඳහා නිලධාරී සංගණනය


## ඊ දත්ත පත්‍රිකාව සම්පූර්ණ කිරීම

මැතිවරණ රාජකාරී සඳහා අයදුම් කිරීමට මෙම දත්ත පත්‍රිකාව මාර්ගගතව සම්පූර්ණ කළ යුතුය.

01. https://eservices.elections.gov.lk/ වෙබ් ලිපිනය භාවිතයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ ඊසේවා වෙබ් අඩවියට පිවිසෙන්න.





02. රාජ්‍ය නිලධාරීන් සඳහා යොමුව හරහා ඊ දත්ත පත්‍රිකාව වෙත යොමු වන්න.







© තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය - මැතිවරණ කොමිෂන් සභාව


03. ඔබේ මැතිවරණ ගිණුමේ පරිශීලක නාමය හා මුර පදය භාවිතා කොට ගිණුමට පිවිසෙන්න.




04. පරිශීලක ගිණුමක් මේ වන විටත් සකසා ගෙන නොමැති නම් https://eservices.elections.gov.lk/ යන ඊසේවා වෙබ් අඩවියේ SignUp හරහා පිවිසී ගිණුමක් සාදා ගන්න.





05. ගිණුම හරහා ඊදත්ත පත්‍රිකාවට පිවිසී හැඳුනුම් පත් අංකය ඇතුළත් කොට ඊ දත්ත පත්‍රිකාව සම්පූර්ණ කිරීම ආරම්භ කරන්න.





හැඳුනුම් පත් අංකය ඇතුළත් කොට යොදන්න බොත්තම එබූ පසු ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචිව සිටි නම් අයැදුම් කරුගේ නම සහ දිස්ත්‍රික්කය පහලින් දිස්වේ.



© තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය - මැතිවරණ කොමිෂන් සභාව




06. මැතිවරණ කාර්යයන්ට අදාල තනතුර : අයදුම් කරුගේ තනතුර හා වැටුප් පරිමාණය අනුව නිවැරදිවම තෝරාගත යුතුය. තෝරා ගන්නා මැතිවරණ තනතුර අනුව සම්පූර්ණ කිරීමට ලැබෙන ඊදත්ත පත්‍රිකාව වෙනස් වේ. තනතුර තෝරා ගැනීම පිළිබඳ නිවැරදි අවබෝධයක් නොමැති නම් සම්බන්ධතා නිලධාරීගෙන් විමසා අදාළ තනතුර තෝරාගන්න.




07. ඉන් පසු නිලධාරියාගේ පුද්ගලික තොරතුරු ඇතුළත් කරන්න.





මෙහි දී නම (මුල් අකුරු සමඟ) : යන ස්ථානයේ මුල කුරු සමග නම ඔබ තෝරා ගෙන ඇති භාෂාවෙන් (සිංහල හෝ දෙමළ භාෂාවෙන් ) ඇතුළත් කරන්න.

ඉංග්‍රීසියෙන් යන ස්ථානයේ ඉංග්‍රීසි භාෂාවෙන් ඇතුළත් කරන්න.

මෙහිදී දුරකතන අංක, ඊතැපැල් ලිපින ආදිය සඳහා නිලධාරියාගේ පුද්ගලික දුරකථන අංක, ඊතැපැල් ලිපින ඇතුළත් කළ යුතුවේ. ( රාජකාරී දුරකථන අංක, ඊතැපැල් ලිපින ඇතුළත් කිරීමෙන් වලකින්න)


© තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය - මැතිවරණ කොමිෂන් සභාව

08. පුද්ගලික තොරතුරු ඇතුළත් කල පසු පුද්ගලික ඡන්ද මධ්‍යස්ථානයේ තොරතුරු ඇතුලත් කරන්න.





එහි පවතින විස්තර නිවැරදි නොවේ නම් වෙනස් කරන්න මත ක්ලික් කර අදාල දිස්ත්‍රික්කය : , ප්‍රා.ලේ.කො. : සහ ග්‍රා.නි.කො. : තෝරන්න. එවිට ඡන්ද මධ්‍යස්ථානය : යටතේ ලැබෙන ලැයිස්තුවෙන් අදාළ ඡන්ද මධ්‍යස්ථානය තෝරා ගන්න.

එසේ ඡන්ද මධ්‍යස්ථානය සොයාගත නොහැකි නම් එය අදාල ස්ථානයේ යතුරු ලියනය කොට ඇතුළත් කරන්න.

09. හදිසි අවස්ථාවක දී දැන්විය යුතු ඥාතියකු පිළිබඳ තොරතුරු යටතේ ඔබට වඩාත් සමීප හදිසි පණිවිඩයක් ලබා දිය හැකි අයකුගේ තොරතුරු ඇතුළත් කරන්න.

10. සේවා විස්තර ඇතුළත් කිරීම සඳහා ඔබ වෙත ලබා දී ඇති ඔබේ ආයතනයට අදාළ ආයතන කේතය යොදා ආරම්භ කරන්න. ආයතන කේතය යෙදූ විට ලැබෙන විස්තර නිවැරදි දැයි පරීක්ෂා කර බලන්න. වැරදි ආයතන කේතයක් ඇතුළත් කිරීම මගින් වෙනත් ආයතනයක් වෙත දත්ත පත්‍රිකාව යොමු විය හැකිය.




එහි වර්තමාන තනතුර : යන ස්ථානයේ ඔබේ වත්මන් තනතුර තෝරා ගන්න. එය එම ලැයිස්තුවේ නොමැති නම් ආයතනයේ සම්බන්ධීකරණ නිලධාරි වෙත දන්වා ඇතුළත් කරවා ගන්න.

තනතුරේ ස්වභාවය : තෝරා ගෙන ක්ෂේත්‍ර කාර්යාලයක සේවය කරන්නේ එම කාර්යාලයේ නම එහි ඇතුළත් කරන්න



© තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය - මැතිවරණ කොමිෂන් සභාව

අදාළ ඉතිරි තොරතුරු ද නිවැරදිව සම්පූර්ණ කරන්න.


11. සේවා විස්තර ඇතුළත් කළ පසු වාර්තා කල හැකි ස්ථානය ඇතුළත් කල යුතුය. මෙහිදී ඊ දත්ත පත්‍රිකාව පිරවීමේදී තෝරාගත් තනතුරට අදාලව වාර්තා කල හැකි දිස්ත්‍රික්කයක් හෝ ඡන්ද මධ්‍යස්ථානයක් තෝරා ගැනීමට තිබේ. ( සහකාර තේරීම් භාර නිලධාරි, ගණන් කිරීමේ නිලධාරි, ජ්‍යෝෂ්ඨ ඡන්ද ස්ථානාධිපති වැනි තනතුරු සඳහා දිස්ත්‍රික්කයක් සහ අනෙක් තනතුරු සඳහා ඡන්ද මධ්‍යස්ථානයක් ලෙස) තෝරාගත යුතුය.




දිස්ත්‍රික්කයක් තෝරා ගැනීමට ඇති නිලධාරීන් සඳහා සේවය සඳහා වාර්තා කිරීමට කැමති දිස්ත්‍රික්ක 05ක් අනුපිළිවෙළින් තෝරන්න.




දැනට දිස්ත්‍රික්කයක් තෝරා ඇති නම් වෙනස් කරන්න මගින් දිස්ත්‍රික්කය තෝරාගත හැකිය. පහසුවෙන් වාර්තා කල හැකි ඡන්ද මධ්‍යස්ථාන 05ක් තේරීමට ඇති නිලධාරීන් පවුලේ ඡන්ද මධ්‍යස්ථානය හැර වඩාත් කැමති ඡන්ද මධ්‍යස්ථාන 05 ක් පිළිවෙලින් තෝරන්න.





තෝරාගත් ඡන්ද මධ්‍යස්ථානයක් වෙනස් කිරීමට අවශ්‍ය නම් වෙනස් කරන්න මගින් සිදු කල හැකිය.


© තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය - මැතිවරණ කොමිෂන් සභාව

12. වාර්තා කල හැකි ස්ථානය පිළිබඳ තොරතුරු ඇතුළත් කල පසු පෙර මැතිවරණයන්හි ඉටුකල මැතිවරණ රාජකාරි විස්තර ඇතුළත් කරන්න.

එහිදී මේ දක්වා ඔබ විසින් පෙර මැතිවරණ වලදී එක් එක් මැතිවරණ තනතුරු වල කටයුතු කල වාර ගණන අදාළ ස්ථානයේ ඇතුළත් කරන්න.




13. අවසානයේ ඔබ හෝ ඔබගේ කලත්‍රයා මීට පෙර ඡන්ද විමසීමක දී ක්‍රියාකාරි දේශපාලන කටයුතු වල (අපේක්ෂකයකු / ඡන්ද නියෝජිතයකු ලෙස) නිරත වී තිබේද ? නැද්ද යන්න තෝරන්න.

ඔව් ලෙස තෝරා ගත්තේ නම් අදාල පරිදි අපේක්ෂකයකු ලෙස ඉදිරිපත් වූ ඡන්ද විමසීම හා වර්ෂය සහ

ඡන්ද නියෝජිතයකු ලෙස සහභාගි වූ ඡන්ද විමසීම හා වර්ෂය යන තොරතුරු සම්පූර්ණ කරන්න.

14. සියලු තොරතුරු නිවැරදි බව යලිත් වරක් තහවුරු කොට සුරකින්න බොත්තම ඔබා අයදුම්පත මාර්ගගතව යොමු කරන්න.




15. අයදුම්පත පිරවීමේදී වෙනම තිරයක් විවෘත වන විට ඒවායේ ඇති සුරකින්න බොත්තම ඔබා තහවුරු කළ යුතුය.

අයදුම්පත සම්පූර්ණ කර යොමුකළ පසු තිරයේ ඔබ ඇතුළත් කල දත්ත දක්නට ලැබෙන අතර ආයතන ප්‍රධානියා ඒවා තහවුරු කරන තෙක් අවශ්‍ය සංශෝධන සිදුකළ හැකිය. එම සංශෝධනයන් සිදුකරන සෑම වාරයකම සංශෝධනයන් ස්ථිර කිරීම සඳහා සුරකින්න බොත්තම ඔබා තහවුරු කළ යුතුය.


© තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය - මැතිවරණ කොමිෂන් සභාව